# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1609/ 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 22/12/2023<br>පැය 1040 |

## මාධ්‍ය නිවේදනය

### විෂ මත්ද්‍රව්‍ය වැටලීම් සඳහා දිවයින පුරා ක්‍රියාත්මක විශේෂ මෙහෙයුම සම්බන්ධ වාර්තාව.

විෂ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හා බෙදා හරින්නන්ගේ ජාලයන් මර්ධනය කර ඔවුන් අත්අඩංගුවට ගැනීම සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි 2023.12.17 වන දින සිට 2023.12.23 වන දින දක්වා විශේෂ මෙහෙයුම් ආරම්භ කෙරිණි.

එයට සමගාමීව 2023.12.21 වන දිනය තුල සිදු කරන ලද මුළු වැටලීම් 1864 කට අදාලව සැකකරුවන් 1810 ක් සහ සැකකාරියන් 55 ක් අත්අඩංගුවට ගෙන ඇත. ඉන් සැකකරුවන් 145 ක් වැඩිදුර විමර්ශන සඳහා රඳවා තබා ගැනීමේ නියෝග ලබා ගැනීමට නියමිතව ඇති අතර, සැකකරුවන් 40 දෙනෙකුගේ වත්කම් සම්බන්ධයෙන් විමර්ශන ආරම්භ කිරීමට නියමිතය. තවද සැකකරුවන් 134 දෙනෙකු පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි.

**මෙම මෙහෙයුමේදී බස්නාහිර පළාත ආවරණය වන පරිදි සිදු කරන ලද මත්ද්‍රව්‍ය වැටලීමේදී හෙරොයින් ග්‍රෑම් 384 ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 408ක්, ගංජා ග්‍රෑම් 1036 ක් පොලිසිය භාරයට ගෙන ඇති අතර එම පළාත තුල සිදු කල මුළු වැටලීම් 799 කදී සැකකරුවන් 793 ක් හා සැකකාරියන් 19 ක් අත්අඩංගුවට ගෙන ඇත.**

**දකුණු පළාත ආවරණය වන පරිදි සිදු කරන ලද මත්ද්‍රව්‍ය වැටලීමේදී හෙරොයින් ග්‍රෑම් 54 ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 ක් හා ගංජා ග්‍රෑම් 1004 ක් ද පොලිසිය භාරයට ගෙන ඇති අතර එම පළාත තුල සිදු කල මුළු වැටලීම් 192 කදී සැකකරුවන් 184 ක් හා සැකකාරියන් 06 ක් අත්අඩංගුවට ගෙන ඇත.**

වැටලීමට අදාල විශේෂිත සංඛ්‍යා තොරතුරු පහත පරිදි සඳහන් කර ඇත.

| හෙරොයින් | | අයිස් | | ගංජා | | | වෙනත් මත් ද්‍රව්‍ය | | මත්පෙති (g/mg) | මුළු වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් මුළු සැකකරුවන් ගණන | | රැඳවා තබා ගැනීමේ නියෝග ලබා ගැනීමට නියමිත සැකකරුවන් ගණන | වත්කම් විමර්ශන ආරම්භ කිරීමට අදහස් කරන සැකකරුවන් ගණන | පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමට අපේක්ෂිත පුද්ගලයින් ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වැටලීම් සංඛ්‍යාව | ප්‍රමාණය (g/mg) | වැටලීම් සංඛ්‍යාව | ප්‍රමාණය (g/mg) | වැටලීම් සංඛ්‍යාව | ප්‍රමාණය (g/mg) | ගංජා පැළ | වැටලීම් සංඛ්‍යාව | ප්‍රමාණය (g/mg) | | | ස්ත්‍රී | පුරුෂ | | | |
| 600 | 613.465 | 378 | 746.795 | 788 | 16562.635 | 272041 | 98 | 51383.318 | 3142 | 1864 | 55 | 1810 | 145 | 40 | 134 |
| 2023.12.17 වන දින සිට 2023.12.21 වද දින දක්වා වූ සමස්ත වැටලීම් වාර්තාව. | | | | | | | | | | | | | | | |
| 3700 | 7785.705 | 1998 | 3907.15 | 4323 | 227198.202 | 546040 | 532 | 150737.318 | 44267.2 | 10553 | 408 | 10048 | 517 | 106 | 886 |

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**